www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආන්ඩුවල නය: ගෝලීය මූල්‍ය අර්බුදයේ නව අවධියක්

## Government debt: a new stage in the global financial crisis

2010 පෙබරවාරි 9

පෙර නොවූ විරූ අයුරින් රැකියා, වැටුප් සහ සමාජ සේවා කප්පාදු කිරීම් හරහා යෝධ බැංකු ඇපකරයන් සඳහා මිල ගෙවීමට ආන්ඩු උත්සාහ කරද්දී වයට එරෙහිව දැවැන්ත සමාජ අරගල ආරම්භ විය හැකි බවට පාලක කවයන් තුල මතු වෙමින් පවත්නා බිය මධ්‍යයේ පසුගිය සතිය පුරා මූල්‍ය වෙලඳපොලවල් හරහා හමාගිය කම්පනයන් මගින් ගෝලීය මූල්‍ය අර්බුදයේ නව අවධියක් සංඥා කරයි.

කාල් මාක්ස් ප්‍රන්සයේ පන්ති අරගලය නම් තම කෘතිය තුල සඳහන් කල පරිදි ''රාජ්‍යයමත් තමා සූරා කෑම සඳහා මූල්‍ය වෘකයන්ට ඉඩ දෙනු ඇතැයි යන විශ්වාසය මත රාජ්‍ය නය රඳ සිටී.'' ප්‍රධාන ධනේශ්වර ජාතීන්ගේ ආන්ඩු ඒවායේ ඒකාබද්ධ දල දේශීය නිෂ්පාදිතයන්ගෙන් සියයට 30 ගනනකට සමාන මුදලක් යොදවමින් බැංකු ගලවාගෙන ඒවායේ ලාභ වැඩි කොට මූල්‍ය වෙලඳපොලවල් පුම්බා ඇපතැබූ පසුගිය මාස 18ක කාලය පුරා වෘකයෝ කෑදර ලෙස ආන්ඩුමත් ගිලදැමූහ.පසුගිය වසරේ කරන ලද කතාවක දී එංගලන්ත බැංකුවේ අධිපති මර්වින් කිං පිලිගත් පරිදි ''මූල්‍ය ප්‍රයත්න ක්ෂේත්‍රයේ කිසිවිටෙක මෙතරම් ස්වල්ප දෙනෙක් මෙතරම් විශාල පිරිසකට මුදල් නයගැති වී නැත.''

විවිධ ඇපතැබීමේ ක්‍රම සහ මැදිහත් වීම් හරහා සංකීර්න ක්‍රියාකාරකම්වල යෙදී සිටින බව පෙනුනද සාරය වසයෙන් ගත්කල ඒවා ඉතා සරල ය. එනම් බැංකු සහ මූල්‍ය ආයතනවල ඩොලර් ට්‍රිලියන ගනන් නය ඒවායේ ගිනුම් පොත්වලින් රාජ්‍යයට මාරු කෙරිනි. දැන් පැමිනෙන්නේ ඊලඟ අවධිය යි. එනම් සමාජ වියදම් සුවිසල් ලෙස කපමින් සහ කම්කරු පන්තියේ ජීවන තත්වයන් ආන්තික ලෙස කප්පාදු කරමින් මෙම නය ආපසු ගෙවීම යි. ග්‍රීක ආන්ඩුව දැනට එහි දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක් වන අයවැය පරතරය ඉදිරි වසර දෙක තුල සියයට 3ක මට්ටමට කැපීමට අපේක්ෂා කරන බව නිවේදනය කරමින් මෙම ක්‍රියාදාමය ග්‍රීසිය තුල ඇරඹී ඇත .

යුරෝපා සංගමය මෙම තීරනය අනුමත කල අතර වෙලඳපොවල් බාධාවකින් තොරව ක්‍රියාත්මක විය. එහෙත් එම තත්වය වහා වෙනස් විනි. කප්පාදු කිරීම්වලට එරෙහිව ග්‍රීසියේ ලබන මාසයේ මහා වැඩවර්ජනයක් පැවැත්වෙන බව නිවේදනය කිරීමත් සමග ''බ්‍රසල්ස් තීරනයේ උනුසුම් දීප්තිය වහා අතුරුදහන් වුනි'' යයි එක් මූල්‍ය චර්චා කරුවෙක් සඳහන් කලේ ය.

ඒ සමගින් ගෝලීය මූල්‍ය වෙලඳපොවල් හරහා හමාගිය කම්පන තරංග මගින් ආන්ඩු සහ මූල්‍ය කව තුල පවතින අන්තර් සම්බන්ධිත භීතීන් දෙකක් පිලිබිඹු කරයි. පලමු කාංසාව වන්නේ ග්‍රීක වර්ධනයන් වනාහි සමස්ත යුරෝපය හා වඩාත් පෘථුල පරිමානව විහිදී යන නය අර්බුදයක ආරම්භක ප්‍රකාශනය පමනක් වීමයි. දෙවැන්න වන්නේ පසුගිය මාස 18 තුල ලෝකය පුරා ආන්ඩු කම්කරු පන්තියේ කිසිදු අර්ථභාරී මැදිහත් වීමකින් තොරව බැංකු සහ මූල්‍ය වෙලඳපොවල්වල ඉල්ලීම් ක්‍රියාවට දැමූ තත්වය අවසන් වීමට ආසන්න බවයි.

ග්‍රීක අර්බුදය දර්ශන පථයට පැමිනි වහා ම අයර්ලන්තය, පෘථුගාලය, ඉතාලිය සහ ස්පාඤ්ඤය යන අනෙකුත් යුරෝපා සංගම් සාමාජිකයන් වෙත අවධානය යොමු විය. නය පැහැරහැරීමේ අනතුරේ පරිමාව විදහා දක්වමින් පසුගිය සතියේ පෘථුගාල නය වෙලඳපොල පුරා පැතිර ගිය නය පැහැරහැරීම් හේතුවෙන් එහි ආන්ඩුවට සැලසුම් කරන ලද කප්පාදු පියවර ක්‍රියාවට දැමිය නො හැකි වේ ය යන භීතිය වැඩි විය. රට පාලනය කල නො හැකි බවට පත් වෙමින් තිබේ යයි ද ''පරදුවට තැබී ඇත්තේ පෘථුගාල රාජ්‍යයේ විශ්වාසනීයත්වය'' යයි ද එක් ඇමතිවරයෙක් භීතිය පලකලේ ය.

පෝල් ක්රුග්මාන් යන නිව් යෝක් ටයිම්ස් ආර්ථික තීරු ලිපි රචකයා ''වඩාත් ම කරදරකාරී ස්ථානය වන්නේ ග්‍රීසිය නොව ස්පාඤ්ඤය'' යයි අනතුරු ඇඟවීමෙන් පසුව ස්පාඤ්ඤ නය සඳහා වන පැහැරහැරීමේ රක්ෂන භාරයන් ද ඉහල නැගුනි. බාක්ලේස් කැපිටල්ට (Barclays Capital) අනුව ශුද්ධ බාහිර නය ප්‍රමානයන් ග්‍රීසියේ දල දේශීය නිෂ්පාදියෙන් සියයට 87ක් ද ස්පාඤ්ඤයේ සියයට 91ක් සහ පෘථුගාලයේ සියයට 108ක් ද වේ.

අර්බුදය ග්‍රීසියට පමනක් හෝ ඊනියා මධ්‍යධරනී රටවලට පමනක් සීමා වේ නම් එය පාලනය කරගත හැකි වනු ඇත. එහෙත් වැඩෙන අයවැය පරතර විශ්වීය ප්‍රපංචයකි. දියුනු ආර්ථිකයන්ගේ නය දල දේශීය නිෂ්පාදිතයට දරන අනුපාතය 2007 වසරේ පැවති සියයට 75ට සන්සන්දනාත්මකව 2014 වනවිට සියයට 115 දක්වා නගිනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ) පුරෝකථනය කර ඇත්තේ සාම කාලසීමාවක පෙර නොවූ විරූ නැග්මක් සනිටුහන් කරමින් සහ එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය වඩාත් ම බලපෑමට ලක් වන රටවල්වලින් දෙකක් බවට පත්කරමිනි.

මේ දක්වා ග්‍රීසියට සහයෝගය නො දැක්වීමට යුරෝපා සංගමය තීන්දු කොට ඇත්තේ එසේ කලහොත් එය අයර්ලන්තය, පෘතුගාලය සහ ඉතාලිය සඳහා පවා ඇපදීමේ පූර්වාදර්ශයක් සකසතැයි බිය වෙමිනි. ඒ අතර ම ජාමූඅ මැදිහත් වීමකට යුරෝපා සංගමය විරුද්ධ වන්නේ සංගමයට අයත් තනි තනි රටවල්වලට ජාත්‍යන්තර ඇපතැබීම යුරෝපීය මූල්‍ය පද්ධතිය ස හ යුරෝ මුදලේ ස්ථාවරත්වය ප්‍රශ්නයට ලක් කරන බැවිනි. සති අන්තයේ පැවති ජී-7 මුදල් අමාත්‍යවරුන්ගේ රැස්වීමක දී ග්‍රීක අර්බුදය යුරෝපීය අධිකාරීන්ට ''කලමනාකරනය'' කරගත හැකි යයි පැහැදිලි කරන ලද්දේ යුරෝපා සංගමයේ පීඩනය පිලිඹිබු කරමිනි.

එහෙත් යුරෝපා සංගමයේ ආකල්පය වඩා දරුනු ගැටලු නිර්මානය කරමින් තිබේ ය යන විවේචන අවුලුවා ඇත. ''යුරෝපය තවත් ගෝලීය අවපාතයක අවදානම ගනී'' යන හිසින් ලියන ලද චර්චාවක ජාමූඅ හිටපු ප්‍රධාන ආර්ථික විද්‍යාඥ සයිමන් ජොන්සන් මෙසේ ලියයිඃ ''විශේෂයෙන් ම ප්‍රන්සය සහ ජර්මනිය ඇතුලුව වඩා ශක්තිමත් යුරෝපා ආර්ථිකයන් දුර්වල යුරෝ කලපීය රටවල්වලට ඔවුන්ගේ නය ගෙවා ගත නො හැකිය ස්වයං-සාධිත බිය-එනම් පොලී අනුපාත ඉහල දැමූ සහ කොටු වූ රටවලට ඇත්ත වසයෙන් ම ගෙවීම දුෂ්කර කල මෙමම උමතුව- පාලනය කිරීමට කරමින් සිටින්නේ කුමක් ද? ගැඹුරු පොකට්ටු සහිත යුරෝපීයයෝ පීඩනය යටතේ පසුවන සියලු රටවල් ඉක්මනින් සහ භව්‍ය ලෙස දේශපාලනිකව අශක්‍ය ආකාරයන්ගෙන් අයවැය පරතර කපා දැමිය යුතු යයි අවධාරනය කිරීමට වැඩි දෙයක් නො කරති. මේ ආකාරයේ අපරීක්ෂාකාරී මූල්‍ය කප්පාදු කිරීම් 1930 ගනන්වල මහා අවපාතය ආරම්භ කිරීමට ඍජුව දායක විය.''

ගෝලීය මූල්‍ය අර්බුදයේ මෙම නව අවධියේ ආරම්භය වැඩකරන ජනයා ඉදිරියේ තීරනාත්මක ගැටලු ඉස්මතු කරයි. පාලක කව පැත්තෙන් ගත්කල සියල්ල රඳා පවත්නේ කම්කරු පන්තියේ අරගල හුදකලා කිරීම, බිඳ විසරුවීම සහ මර්දනය කිරීම කලහැක්කේ කුමන පමානයකට ද යන්න මත යි. කප්පාදු කිරීම්වලට එරෙහි මහජන විරුද්ධත්වය නිශ්ක්‍රීය කිරීම, එය ජාතිකවාදී දිශා ඔස්සේ දැක්කීම සහ සියල්ලට ඉහලින් සමාජවාදී ඉදිරිදර්ශනයක් වර්ධනය වීම වැලැක්වීමට ඔවුහු ඍජුව ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සහ වෘත්තීය සමිති නායකත්වයන් මත රඳා සිටිති.

එහෙත් අර්බුදයේ ස්වභාවය ම ජාත්‍යන්තර කම්කරු පන්තිය සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම්ව ජාත්‍යන්තරව එක්සත් කිරීමේ වෛෂයික අවශ්‍යතාව ඉස්මතු කරයි. ගෝලීය මූල්‍ය පද්ධතියේ සංකීර්න අන්තර් සම්බනධතාවල අර්ථය වන්නේ එක් කලාපයක අර්බුදයක් ක්ෂනිකව සමස්ත පද්ධතිය පුරා පැතිරෙන බවයි. එක්සත් ජනපදයේ අවමුඛ නය අර්බුදය මූලිකව ගෝලීය මූල්‍ය අර්බුදය ඇති කරන ලද අතර දැන් යුරෝපය තුල නය පැහැරහැරීම් එය තවත් ගැඹුරු කිරීමට තර්ජනය කරයි.

එමනිසා සමස්ත බැංකු සහ මූල්‍ය පද්ධතියේ අයිතිය පවරාගැනීම සහ එහි සම්පත් මහජන සහ ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ තැබීම ඉල්ලා සිටිමින් මෙම අර්බුදය වැඩකරන ජනතාවගේ සහ සමස්ත සමාජයේ අවශ්‍යතා මත විසඳීම සඳහා සෑම රටක් පුරා ම දේශපාලන අරගල දියත් කරනු ලැබිය යුතු ය. මූල්‍ය කතිපයාධිකාරයේ ග්‍රහනය බිඳලිය හැක්කේ ද බැංකුවල ලාභ සඳහා නොව මානව අවශ්‍යතා ඉටු කල හැකි වන පරිදි සමාජය යලි ගොඩනැංවිය හැක්කේ ද එමගින් පමනි.

**නික් බීම්ස්**



© www.wsws.org